# විස කෑම සහ කැවීම

ඔබ ඔබට ආදරය කරනවාද?

පළමුව එසේ කරන්න නොඑසේනම්,

මා ඔබෙන් ආදරය ඉල්ලීමෙන් ඵලක් නැත

මක්නිසාද, තමාට ආදරය නොකරන්නාට

කිසිවක වැදගම්මක් නැත.

ඔබ ඔබගේ මවට ආදරය කරනවාද?

දෙවනුව එසේ කරන්න

නොඑසේනම්, මා ඔබෙන් ආදරය ඉල්ලීමෙන්

ඵලක් නැත. මක්නිසාද, තම මවට ආදරය

නොකරන්නා මෙලොව කිසිවෙකුටත් ආදරය

නොකරන බැවිනි.

තෙවනුව මා මෙසේ අසමි.

ඔබ ඔබගේ ලංව හිඳින්නන් හට ආදරය

කරනවාද? නොඑසේනම්, මා ඔබෙන් ආදරය

නොඉල්ලමි.

ඔබ දන්නා හඳුනන හැමොන්ටම ආදරය

කරන්නෙක්ද? එසේ නම් ඔබ සුන්දර

මිනිසෙකි.

මා දැන් මෙසේ අසමි

ඔබ මට ආදරය කරනවාද?

එසේනම්, ඔබට මිනිස් වර්ගයාටම ආදරය කළ

හැක. මක්නිසාද, ඔබ මා නොහඳුනන බැවිනි.

එසේ හැකිනම්, ඔබ

**අතිශය සුන්දර මිනිසෙකි**

## එවන්වූ අතිශය සුන්දර මිනිසුන්ටයි

මිනිසත් බව ලැබූ අපට පමණක් නොව ලොව වෙසෙන සියළු සතුනටම,

කුසගිනි නිවා ගැනීමට ආහාර, බීමට පිරිසිදු ජලය, හුස්ම ගැනීමට පිරිසිදු වාතය සැනසිල්ලේ සිටීමට තැනක් අත්‍යාවශ්‍යය.

මේ හැරුණු විට, අප සංකීර්ණවූ ද්විතික අවශ්‍යතා රැසක් පසුපස හඹා යන්නෙමු. මේ සියල්ල අප ලබා ගන්නේ පරිසරයෙනි. බොහෝ විට දැන හෝ නොදැන පරිසරයට හානි කරමිනි.

ඉර හඳ, අහස පොළොව, අව්ව වැස්ස, ගහ කොළ, සතා සිපාවුන්, පරිසරයේ මූලික අංගයන්ය. ඉරෙන් ලැබෙන ශක්තිය, ගහ කොලින් ලබාගෙන, පොළොවෙන් පොහොර හා ජලයද, වායුගෝලයෙන් වාතයද ලබාගෙන ආහාර නිපදවා සතා සිපාවුනට පුද කරයි.

ආහාර නිපදවීමේ මෙම ක්‍රියාවලිය 100% ක්ම ස්වාභාවික වූවකි. මෙයට මිනිසා මැදිහත් වීමෙන් කෘෂි කර්මාන්තය ලෙස නම් වැටිණි. එහිදී බුදුන් සරණ, තම තමන් අදහන දෙවියන්ගේ පිහිට, ඉරු දෙවියන්ගේ පිහිට, පාරම්පරික කෙම් ක්‍රම, ගහ කොළින් සතුන් ගෙන් ලැබුන පොහොර ටික, අතේ පයේ හයිය, සාමුහිකත්වය ඔවුනගේ ශක්තිය විය.


**එස්.බී. සමරණ උදයන්ති**

**කෘෂිකර්ම උපදේශිකා**

**බීජ පරීක්ෂණාගාරය, බටඅත.**


කෘෂි කර්මාන්තය ජීවනෝපාය කරගත් ඔවුන්, කන බත්පතට වස නොදැමූහ. බොන වතුර බිඳුට වස නොදැමූහ. හුස්ම ගන්නා වායුපොද නොකෙළසූහ. මහපොළොව හා ගැටෙමින්,

දෙවියන් බුදුන් පුදමින් සුවහසක් කුසගිනි නිවාලූ ඔවුන් ගොවි රජුන්ය. සැමටම ආදරය කළ ඔවුන් සැබැවින්ම සුන්දර මිනිසුන්ය. එම පැරණි ශිල්ප ක්‍රම නොදියුණු යැයි කියමින්, තමා දියුණු යැයි කියා ගන්නා වත්මන් පරපුර විසින් වාණිජත්වයට ගැතිවී මා ඉහතින් විස්තර කළ ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට අතරමඟදී වස (කෘත්‍රිම පොහොර පළිබෝධනාශක) එක් කරමින් සිටී. එදා කෘෂි කර්මාන්තය අද වාණිජ කෘෂි කර්මාන්තය ලෙසට නම් කර ඇත.

වස ගැන දීර්ඝ විස්තරයක් කළහොත්, මෙම ලිපිය දිගුවනු ඇත. ලංකාවට ගෙන්වන ලද පළමු පළිබෝධනාශකය D.D.T ය. ඒ 1958 දී එනම් මීට වසර 50 කට පමණ පෙර, මදුරු මර්ධනය සඳහාය. නමුත් මදුරුවන් මර්ධනය වී ඇත්ද? තාවකාලිකව මර්ධනය විය. නමුත් මදුරුවන් ශක්තිමත් වී වර්ධනය වී ඇත. චිකුන්ගුන්යා, ඩෙංගු වැනි මාරාන්තික රෝග පතුරවමින් වියරු සිනහවක් පෑවේ අපගේ මෝඩකමට නොවේද? මදුරුවන් වාසස්ථාන සපයා දෙකොන ගිණිගෙන දඟලා වැඩක් නැත. අප අවට පරිසරයේ සනීපාරක්ෂාව රැකගත යුතුය.

**වසකා මියෙමුද? අපි ජීවත් වෙමුද?**

1974 වසරදී ඒකක බිමකට යොදන ලද පළිබෝධනාශක ප්‍රමාණය 1995 වන විට විසිගුණයකින් පමණ වැඩිවී ඇත. ගුණාකාර වලින් වස යොදා ගුණාකාර වලින් අස්වනු වැඩිකරගෙන ඇත්ද? නැත. එහෙත් අප ගුණාකාර වලින් වස කමින් සිටින්නෙමු.

ස්වාභාවික පරිසරයේදී ඕනෑම ජීවියෙක් ස්වාභාවිකවම තුලනය වේ. අප සිදුකර ඇත්තේ එම තුලන අවස්ථාව නැති කිරීමයි. පළිබෝධ ශක්තිමත් කළේද අප විසින්මයි.

දැන් අප කන්නේ වසය. හුස්ම ගන්නේද වසය. පොළොවද වස නිසා අජීවීය. කොටින්ම කියතොත් අපද, වසවී හමාරය. මුදලට යටවී ඇනකොටා ගනිමින්, මරා ගනිමින්, අනෙකාට වස කවමින්, වස පොවමින් පරිසරයද තව තවත් කෙළෙසමින්, අපි දැන දැනම නමුත් නොදන්නාසේ විනාශයට දුවමින් සිටී. අපට කෝටියක් ලෙඩය. ජීවත් වෙන්නේ බෙහෙත් බලයෙනි. කන වස විසේ තරමට මෙහෙමවත් ඉන්නවා ඇති යන්න බොහෝ දෙනා මුවින් නික්මේ. දැන් සිටින්නේ රතු කට්ටයේය.

එක්වරම ආපස්සට හැරිය නොහැකි බව මාද දනිමි. ටිකෙන් ටික ආපසු හැරෙමු. මුලින්ම වස භාවිතය අඩු කරමු. බැරිම තැනකදී යොදා ගනිමු. එදාට වඩා දියුණු ශිල්ප ක්‍රම අද ඇත. ඒවා හිතකර ලෙස යොදා ගනිමු. බිම් සැකසීමේ බීජ යෙදීමේ පටන්ම යාන්ත්‍රික ක්‍රම, රෝපණ ක්‍රම භාවිතා කරමු. රසායනික ක්‍රම ඈත් කරමු. අපගේ වගාවේ සනීපාරක්ෂාව රැක ගනිමු. මියැදුණු පසට යළි ජීවය දෙමු. පස හා අවට පරිසරයේ හිතකර ජීවී ගහණය වඩවා ගනිමු. කොම්පෝස්ට්, පණු දියර, පොහොර ආදිය වැඩි වැඩියෙන් යොදා ගනිමින් කාබනික ගොවිතැනට පිවිසෙමු. අපි අපේ පරිසරයට ආදරය කරමු. නිරෝගි වන සජීවී වන, සක්‍රිය වන පස හා අවට පරිසරය අපට නිරෝගි, පළිබෝධ හානි අවම, හොඳ එලදාවක් ලබා දෙනු නියතය. අපි දෙවියන් බුදුන් අදහමු. වගාව ආරම්භයේදී බුදු සරණ, දෙවි පිහිට පතමු. හැමදම හවසට බුදුන් වඳිමු. දෙවියන්ට පින් අනුමෝදනා කරමු. පෝයටවත් පන්සල් යමු. කන බත් පසට වස දමන, බොන දිය බිඳට වස දමන පාපතරයන් නොවෙමු. අස්වැන්න ගෙට ගත් විට යායම එක්වී බුදුන්ට කිරි දනයක් පූජා කරමු. දෙවියන්ට පැණි බතක් පූජා කරමු. පරිසර හිතකාමී ගොවියන් වෙමු. ගොවි රජුන් වෙමු. සකළ ලෝ සතුනටම ආදරය කරන අතිශය සුන්දර මිනිසුන් වෙමු.

"අපි වවමු - රට නගමු" කාබනික ගොවිතැනට පිවිසෙමු.